# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2274/13 – 2022 අප්‍රේල් 06 වැනි බදාදා – 2022.04.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ප්‍රා. ලේ. යොමු අංකය.: ELDS/LND/04/COMM/2016/05-II.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.: 4-3/5/2018/HA/55.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නවදුන් කෝරළේ පල්ලෙ පත්තුවේ, ඇලපාත ග්‍රාම නිලධාරී වසමේ (අංක 185), ඇලපාත ගම පිහිටි හෙක්ටයාර් 0.9013 ක් වූ උඩුමුල්ලළගහේන, කටුකිතුලහේන, ඉඹුල්ගලහේන්යාය, ගැටදෙල්ගහදෙනිය නමැති ඉඩම. සැලැස්මේ අංකය: අ. ග. පි. 75, අතිරේක අංකය 39, පත්‍ර අංකය 39, ප්‍රමාණය හෙක්. 0.9013.

| කැබලි අංකය | ප්‍රමාණය හෙක්ටයාර් | මායිම් | | | |
|---|---|---|---|---|---|
| | | උතුරට | නැගෙනහිරට | දකුණට | බටහිරට |
| 326 | 0.8119 | කැබලි අංක 20 | කැබලි අංක 327 | කැබලි අංක 327 සහ 20 | කැබලි අංක 20 |
| 327 | 0.0413 | | | | |
| 328 | 0.0174 | | | | |
| 329 | 0.0308 | කැබලි අංක 328 | කැබලි අංක 20 | කැබලි අංක 20 | කැබලි අංක 20 සහ 328 |

හිමිකම් කියන්නා : රජය (ඉඩම් අත්කර ගැනීමේ ආඥා පනතේ 38(අ) අතුරු විධාන ආඥාව නිකුත් කර ඇත. මුල් හිමිකම් කියන්නා වක්කුඹුරගේ ආනන්ද වීරසිංහ මහතා සහ තවත් අය) ඉහත සඳහන් ඉඩමට / පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 ජූනි 27 වැනි දින පෙ. ව. 10.00ට ඇලපාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2022 ජූනි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/ පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. අයිතිවාසිකම් සනාථ කිරීම සඳහා ලිපිලේඛන එදිනට මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

එස්. ඒ. දිල්රුක්,
ප්‍රාදේශීය ලේකම්,
ඇලපාත.

2022 මාර්තු මස 31 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ඇලපාත.

EOG-04-0025

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.